**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව නිකුත් කිරීම පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය**

***2017 සැප්තැම්බර් 26 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව:*** 2017 සැප්තැම්බර් 21 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව ඉදිරිපත් කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුටින් පිළිගනී. රජය දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ ඊලග පියවරයන් වෙත දැඩිලෙස  කැපවිය යුතු යැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ මීලඟ විවාදයන් සිදු වන්නේ කවදා ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනා කෙටුම්පත සමග අවසන් වාර්තාව නිකුත් කරනු ලබන්නේ කවදා ද, සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනා කෙටුම්පත සලකා බැලීම සහ අනුමැතිය සිදුවියයුතු බවට යොදාගෙන ඇති දිනය කවදා ද යනාදිය පිළිබඳව පැහැදිලි දිනයන් ලබා දීම මීට ඇතුලත් වේ. අතුරු වාර්තාව හෝ අවසන් වාර්තාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් යෝජනාව පිළිබඳව වැඩිදුර මහජන මත විමසීම් සැලසුම් කර ඇති ආකාරය පිළිබඳව පැහැදිලි බවක් අවශ්‍ය බවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කියා සිටී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ ඉතිරිව ඇති අවධීන් සඳහා මනා පැහැදිලි මාර්ග සිතියමක් සහ පැහැදිලි කැපවීමක් අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන්ම මෙම වර්ෂය තුල මෙම ක්‍රියාදාමය සම්බන්ධයෙන් වූ පැහැදිලි බවෙහි අඩුව, ප්‍රමාණවත් නොවන ප්‍රමුඛතාකරණය සහ ඒ අනුව උද්යෝගීමත් බවෙහි අඩුකම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දිගින් දිගටම පෙන්වාදුන් පරිදි, දැඩි සැලකිල්ලෙන් යුතුව සනිටුහන් කර ගනී.

අතුරු වාර්තාව නිකුත්කරන බවට මුලින් පොරොන්දු වුයේ 2016 දීය. එබැවින් එය ඉදිරිපත්කොට ඇත්තේ සැලැකිය යුතු තරම් වූ ප්‍රමාදයකින් යුතුවය. මෙම ක්‍රියාදාමය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩල සාමාජිකයන්හට පවා පවතින තොරතුරු හා මගපෙන්වීම් පිළිබඳව වන ඌණතාවය මීට ආවේනික වුවක් බව පෙනී ගොස් ඇත. 2015 දි හා 2016 දී බෙහෙවින් බලාපොරොත්තු දැල් වූ ආරම්භයකින් පසු මෑත කාලයේ පැවැති පැහැදිලි බවක්, කේන්ද්‍රගත වූ බවක් හා වේගයක් නොමැති වීම තුල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ ගාමක බලයෙහි යම් මට්ටමක දුබල වීමක් දක්නට ඇත. මෙම තත්ත්වය ප්‍රතිසංස්කරණ විරෝධී බලවේගයන් ගනනාවකට කණ්ඩායම් ගැසීමට සහ සංවිධානය වීමට මෙන්ම ප්‍රතිසංස්කරණ විරෝධී සිද්ධි දාමයන් හට දැඩිලෙස  මුල් බැසගැනීමටද ඉඩකඩ සලසා ඇත. මෙම සිද්ධි දාමයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට පමණක් නොව රජයේ පුළුල් ප්‍රතිසංස්කරණ න්‍යායපත්‍රයටද තර්ජනයක් වෙයි.

සර්වග්‍රාහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයකට වර්තමානයේ පවත්නා ඓතිහාසික ඉඩකඩ නාස්ති කිරීම කිසිසේත්ම නොකළ යුත්තක් වෙයි. මින් පෙර ශ්‍රී ලංකාවේ ඉතිහාසය පුරාම සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ උත්සාහයන් අසාර්ථක වුයේ ඒවායෙහි පැහැදිලි බව, මගපෙන්වීම සහ නිසි උද්යෝගීමත් බව නොමැති වූ නිසාමය. මෙවර මෙය වලක්වාගෙන ක්‍රියාදාමය සාර්ථක කර ගැනීමේ එකම මඟ වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාදාමයෙහි මීලග පියවරවල් සවිස්තර ලෙස දක්වා ඒ සඳහා පැහැදිලි ලෙසම කැපවීමයි.